16

# චරිකතා කාව්‍යයක් වශයෙන් යසෝදරාවතෙහි පවත්නා අගය පිළිබඳ විමර්ශනයක්

*මදූෂානි, ඩී. එම්. එච්. එම්.* [1]

ලාංකේය සාහිත්‍ය ඉතිහාසයේ හමුවන ප්‍රථම ස්ත්‍රී චරිතාපදානය වන 'යසෝදරාවත' මහනුවර යුගයේ දී රචනා වූ චූල සම්ප්‍රදායේ ජන කාව්‍යයක් වන අතර කර්තෘ අඥාත ය. නමුත් උඩුගම්පොළ කුමාරිහාමිගේ නිර්මාණයක් බවට ද මතයක් පවතී. කෝට්ටේ යුගයේ දී මුලින් ම චරිතකතා කාව්‍යයක් ලෙස 'පැරකුම්බාසිරිත' රචනා වුව ද එය ප්‍රශස්තියකි. එලෙස ඇරඹෙන චරිතකතා පද්‍ය සාහිත්‍යයේ යසෝදරාවතට විශේෂ ස්ථානයක් හිමි වී තිබේ. එයට හේතු සාධකය වන්නේ පරිහානිකර යුගයක මෙය රචනා වීමයි. මෙරට රාජ්‍ය පාලන බලය සිංහල බෞද්ධ පාලකයාගෙන් ගිලිහී නායක්කාර් වංශික රජුන්ට හිමි වීමත්, විදේශාක්‍රමණත් හේතුවෙන් මහනුවර යුගයේ දී රාජ්‍ය පාලන තන්ත්‍රය අරාජික විය. එහි බලපෑමෙන් ආර්ථිකය, සමාජය, ආගමික, සාහිත්‍යය යන සියලු ක්ෂේත්‍රයන් ද බිඳ වැටිණ. එනිසා මහනුවර යුගයේ ජන ජීවිතය ද ව්‍යාකූල විය. සමාජ සංස්ථාවේ කුඩා ම ඒකකය වූ පවුල තුළ අඹු-සැමි සබඳතාවේ දෘඪ බව වියැකිණ. එකල පාලකයන්ගේ ප්‍රීණනය උදෙසා බිරිඳ හෝ දියණිය පිරිනමා අත්ථි සංග්‍රහ කළ පුරුෂයන් නිසා කාන්තාවන්ගේ ලිංගික ජීවිතය, විවාහය වැනි සබඳතා සරල විය. එකගෙයිකෑම වැනි විවාහ චාරිත්‍ර ක්‍රියාත්මක වූ එම සමාජයේ ස්ත්‍රිය, ලිංගික වහලියක සහ තම පරපුර ඉදිරියට ගෙන යාමට පුතකු ලබා දෙන සහායිකාවක පමණක් විය. එනිසා කාන්තාවන්ගේ ගුණධර්ම පිරිහී පතිභක්තිය අගය නොකළ ලිහිල් දිවියකට ඔවුහු අනුගත වූහ. මෙනිසා පරිහානිකර යුගයක ස්ත්‍රියගේ දුරාචාරයන් වළක්වනු පිණිස ඇයට සදුපදේශයන් ලබා දීමට අරමුණු කළ අප කවියාට යසෝදරාවගේ චරිතය තරම් ආදර්ශමත් තවත් චරිතයක් නොවී ය. බෞද්ධාගමික පරිසරයෙන් ඔපවත් වූ බෞද්ධ සංස්කෘතියේ ගෞරවණීය චරිතය වන යසෝදරාවගේ ගුණ කදම්බයෙන් මෙකල ස්ත්‍රියට සදුපදේශ ලබා දීමට මෙම කාව්‍යය රචනා විය. විශේෂයෙන් ම 'පෙදෙන් බුදුසිරිතැ' යන නියමය ගුරු කොට සැලකූ පසුබිමක 'යසෝදරාවත' වැනි චරිතකතා කාව්‍යයක් රචනා වීමෙන් එහි සමාජ අවශ්‍යතාව ස්ඵුට වේ. මෙම කාව්‍යයෙන් චූල සම්ප්‍රදායේ ජනකාව්‍යයක විද්‍යමාන වන පුනරුක්තිය වැනි දෝෂයන් දිස්වුව ද කවියාගේ දූෂණය භූෂණයක් ම ය. මක්නිසා ද නූගත් ජනකවියාගේ දොස සෑම කල්හි ම ප්‍රතිභාව මඟින් වසාලයි. 'යසෝදරාවත' ජනකාව්‍යයක් වුව ද එහි සාහිත්‍යයමය සහ සමාජීය අගය සුවිසල් ය. මෙහි ඉතා සියුම් මානව හැඟීම් ඉතා උසස් ලෙස කවියට නඟා ඇත. මෙම අධ්‍යයනයෙන් 'යසෝදරාවත' කාව්‍යය, සාහිත්‍ය මූලාශ්‍රයයක් ලෙස භාවිත කොට චරිතකතා කාව්‍යයක් වශයෙන් එහි අගය පිළිබඳ විමර්ශනය කිරීමට අපේක්ෂිත ය. මෙම කාව්‍යය සියුම් ලෙස අධ්‍යයනයේ දී තත්කාලීන ස්ත්‍රියට සදුපදේශ ලබා දීමට තරම් ස්ත්‍රී ගුණධර්ම පිරිහී තිබූ බවත් එයට මහනුවර යුගයේ පරිහානිකර සමාජාර්ථික පසුබිම හේතු වූ බවත් විද්‍යමාන ය. එනිසා චරිතකතා කාව්‍යයක් ලෙස යසෝදරාවතෙහි අගය සාර්වත්‍රික, සර්වකාලීන බව නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පද : යසෝදරාවත, චරිතකතා කාව්‍ය, මහනුවර යුගයේ ස්ත්‍රිය, චරිතය, කාව්‍යෝක්ති

---

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) පළමු වසර. සිංහල අධ්‍යයනාංශය.*